Smart Remit Mobile Application - නියමයන් හා කොන්දේසි

පහත සඳහන් නියමයන් හා කොන්දේසි මගින් (මෙහි මින්මතු "BOC Smart Remit යෙදුම " ලෙස හඳුන්වනු ලබන) BOC Smart Remit ජංගම යෙදුම වෙත ප්‍රවේශවීම හා එහි භාවිතයන් පාලනය කරනු ලබයි.

1. BOC Smart Remit යෙදුම භාවිතකිරීම සඳහා වන සුදුසුකම් නිර්ණායක

1.1. පරිශීලකයා,

(අ) වයස අවුරුදු 18 ට වැඩි විය යුතුය;

(ආ) සතුව විදේශ හර හෝ ණය කාඩ්පතක් තිබිය යුතුය;

(ඇ) සතුව ගිවිසුමකට ඇතුළත් වීමේ නෛතික හැකියාවක් තිබිය යුතුය;

(ඈ) සතුව වලංගු විදේශ ගමන් බලපත්‍රයක් තිබිය යුතුය.

1.2. BOC Smart Remit යෙදුම හරහා ගනුදෙනුකරුවන් වෙත පිරිනමන ඕනෑම සේවාවක් බැංකුවේ අභිමතය පරිදි සහ/හෝ පරිශීලකගේ සුදුසුකම් නිර්ණායක මත පදනම් වන අතර එවැනි සේවාවන් යම් යම් නියමයන් හා කොන්දේසිවලට යටත් වේ. මෙම නියමයන් හා කොන්දේසි සහ Smart Remit යෙදුම මගින් සපයා ඇති අනෙකුත් සේවාවන් සඳහා වන නියමයන් හා කොන්දේසි අතර ගැටුමක් ඇති වුවහොත්, එවැනි සේවාවන් සම්බන්ධයෙන් විශේෂ නියමයන් හා කොන්දේසි බලපැවැත්වේ.

1.3. තවද, Smart Remit යෙදුමේ නියමයන් හා කොන්දේසි සහ ගිණුමේ නිශ්චිත ප්‍රභේදයකට හෝ යම් නිශ්චිත සේවාවකට/ පිරිනැමීමකට අදාළ යම් නිශ්චිත නියමයන් හා කොන්දේසි අතර අනනුකූලතාවක් ඇතිවන අවස්ථාවක, එම විශේෂ සේවාවට/ පිරිනැමීමට අදාළ විශේෂ නියමයන් හා කොන්දේසි බලපැවැත්වේ.

2. පරිශීලකයන් ලියාපදිංචිකිරීමේ ක්‍රියාවලිය

2.1. BOC Smart Remit යෙදුමේ සේවාවන් වෙත ප්‍රවේශ වීම සඳහා, පරිශීලක විසින් යෙදුමට අනුකූල වන ජංගම දුරකථනයක් සතුව ඊට යෙදුම බාගත කිරීම අවශ්‍ය වේ.

2.2. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මාර්ගෝපදේශයන්ට අනුකූලව පරිශීලකගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ඔහු/ඇය විසින් බැංකුවට අවශ්‍ය හඳුනාගැනීමේ තොරතුරු සහ පරිශීලකගේ ඡායාරූප ලබා දිය යුතුය.

2.3. පරිශීලක විසින් අවශ්‍ය සියලුම තොරතුරු සහ ලේඛන සැපයිය යුතු අතර බැංකුව විසින් නියම කර ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය.

2.4. පරිශීලක බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් කටයුතු කිරීමට (Customer Due Diligence), මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට (AML) සහ ඔබේ ගනුදෙනුකරු හඳුනාගැනීමට (KYC) අදාළ නියමයන්ට යටත් විය යුතු අතර ඒවාට අනුකූල විය යුතුය.

2.5. පරිශීලකව මෙම යෙදුමට ඇතුළත්කර ගැනීමට අදාළව බැංකුව විසින් ස්ථාපිත යම් ක්‍රියාපටිපාටියකට/ප්‍රමිතියකට අනුකූල වීමට නොහැකි වීම; යෙදුම භාවිතකිරීම සම්බන්ධයෙන් පරිශීලකගේ හැසිරීමෙන් පරිශීලකගේ නෛතික අභිප්‍රායන් හෝ අරමුණු පිළිබඳ බැංකුවට සැක කිරීමට හේතු තිබීම; පරිශීලක දැන් සිටින ස්ථානය හඳුනාගැනීමට බැංකුවට නොහැකි වීම; ලේඛනයේ/ලේඛනවල නිරවද්‍යතාව පිළිබඳව කුමන ආකාරයේ හෝ සාධාරණ සැකයක් බැංකුවට තිබීම වැනි පරිශීලක නියමයන් සපුරාලනු නොලබන්නේ නම්, Smart Remit යෙදුම භාවිතය සඳහා පරිශීලක ඇතුළත් කිරීමෙන් වැළකී සිටීමට බැංකුවට අභිමතය ඇත.

3. පුද්ගලික හැඳුනුම් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය සහ එක් වරක් පමණක් භාවිතවන මුරපදය (OTP)

3.1. Smart Remit යෙදුමේ සේවාවන් සඳහා පරිශීලක හඳුනාගැනීමට විද්‍යුත් තැපැල් ලිපිනය සහ පුද්ගලික හැඳුනුම් අංකය (PIN) නම් කිරීමේදී මාර්ගගතව බැංකුව සපයන මාර්ගෝපදේශ පරිශීලක විසින් අනුගමනය කළ යුතුය. "PIN" යන්නෙන්, පරිශීලක විසින් රහසිගතව මුල්වරට සාදන ලද රහස් අංකය අදහස් වේ.

3.2. සහතිකකිරීම සඳහා OTP අවශ්‍ය ගනුදෙනුවලදී පරිශීලකගේ ලියාපදිංචි ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයකින් (SMS) සහ විද්‍යුත් තැපෑලෙන් බැංකුව විසින් එවනු ලබන එක් වරක් පමණක් භාවිතවන මුරපදය (OTP) භාවිතකරන ලෙස බැංකුව විසින් එහි හුදු අභිමතය පරිදි පරිශීලකට නියම කරනු ලැබේ. අදාළ ඕනෑම විටක සහ ඕනෑම අවස්ථාවක OTP ඇතුළත් කිරීමට පරිශීලක එකඟ වේ. බැංකුව විසින් එවනු ලබන කෙටි පණිවිඩ ලැබීමට භාවිතකරන එක් එක් ජංගම දුරකථන/අංක හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගවල ආරක්ෂාව සඳහා පරිශීලක වගකිව යුතු බව පරිශීලක විසින් එකඟ වේ. සියලුම ඉලෙක්ට්‍රොනික උපාංග සහ කෙටි පණිවුඩ රහසිගතව සහ ආරක්ෂිතව තබාගැනීමට සහතික වීම

පරිශීලකගේ වගකීම වේ.

3.3. PIN අංකය, ඉලෙක්ට්‍රොනික උපාංගය/උපාංග සහ එහි පිවිසුම් මුරපද හෝ පිවිසුම් කේත, එක් වරක් පමණක් භාවිතවන මුරපදය රහසිගතව තබාගැනීම සහ BOC බැංකුවේ Smart Remit යෙදුම වෙත ප්‍රවේශය සුරක්ෂිත කිරීම සඳහා වෙනත් ඕනෑම ක්‍රියාවක් සිදුකිරීම සඳහා පරිශීලක සද්භාවයෙන්, සැලකිල්ලෙන් සහ උද්‍යෝගයෙන් ක්‍රියා කළ යුතුය. කිසිම අවස්ථාවක කිසිඳු තත්ත්වයක් යටතේ, පරිශීලක විසින් සිය PIN අංකය හෝ එක් වරක් පමණක් භාවිතවන මුරපදය වෙනත් කිසිඳු පුද්ගලයකුට හෙළිදරව් නොකළ යුතුය නැතහොත් ඔබ භාවිතකරන ජංගම උපාංගය වෙනත් පුද්ගලයකු අතට පත්වීමට හෝ පාලනය කිරීමට අවසර නොදිය යුතුය.

3.4. යම් ගැටළු සහගත තත්ත්වයක් ඇති වුවහොත්, PIN අංකය නැවත සැකසීමට බැංකුව විසින් ලබා දී ඇති උපදෙස් අනුගමනය කිරීමට පරිශීලක එකඟ වේ.

3.5. වෙනත් පුද්ගලයකුට PIN අංකය සහ/හෝ එක් වරක් පමණක් භාවිතවන මුරපදය අහම්බෙන් හෝ අනවසරයෙන් හෙළිදරව් වුවහොත් පරිශීලක ඊට සම්පූර්ණයෙන්ම වගකිව යුතු අතර අනවසර පුද්ගලයන් විසින් සහ/හෝ අනවසර කාර්යයන් සඳහා භාවිතකරන PIN අංකය, එක් වරක් පමණක් භාවිතවන මුරපදය හෝ ජංගම උපාංගයේ අවදානම ද ඔහු/ඇය විසින් ගතයුතුය.

3.6. කිසියම් අනවසර පුද්ගලයකු වෙත PIN අංකය හෙළිදරව් වීමෙන් හෝ කිසියම් අනවසර සේවාවක් සඳහා PIN අංකය යොදාගත් බව දැනගත් පසු හෝ එවැනි සැකයක් මතු වුවහොත්, පරිශීලක ඒ බව හැකි ඉක්මනින් බැංකුවට පැමිණ හෝ +94 112203750-54 සහ +94 767225023 අංකය ඔස්සේ දුරකථනයෙන් බැංකුවේ සම්බන්ධතා මධ්‍යස්ථානයට දැනුම් දිය යුතුය. (තවද, පරිශීලක විසින් බැංකුවට ලබා දී ඇති ඕනෑම තොරතුරක් ලිඛිතව තහවුරු කරන ලෙස බැංකුව විසින් පරිශීලකගෙන් ඉල්ලා සිටිය හැකිය) සහ, එවැනි දැනුම්දීමක් පිළිබඳව බැංකුවට සත්‍ය තොරතුරක් ලැබෙන තුරු, අනවසර පුද්ගලයන් විසින් සහ/හෝ අනවසර කාර්යයන් සඳහා හෝ BOC Smart Remit යෙදුම භාවිතයෙන් සිදු කරන ලද සියලුම ගනුදෙනු සඳහා පරිශීලක වගකිව යුතුය.

4. BOC SMART REMIT යෙදුම හරහා සිදුකරන ගනුදෙනු

4.1. BOC Smart Remit යෙදුම ලියාපදිංචිකිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් සහ එය මාර්ගගතව භාරගැනීමෙන්, BOC Smart Remit යෙදුම හරහා පරිශීලක විසින් බැංකුව වෙත ලබාදෙන උපදෙස් හෝ පණිවිඩ පිළිගැනීමට සහ/හෝ ඒවා අනුව කටයුතුකිරීමට පරිශීලක විසින් බැංකුවට බලය ලබා දේ.

4.2. පරිශීලක විසින් ප්‍රතිලාභීන්ගේ තොරතුරු භාවිතකරමින් BOC Smart Remit යෙදුම හරහා ප්‍රේෂණ ඉල්ලීමක් කළ විට, එවැනි ඉල්ලීමක් ලැබුණු බව දන්වා පරිශීලකට විද්‍යුත් පණිවිඩයක් එවනු ලැබේ. මුදල් ප්‍රේෂණය කිරීම සඳහා පරිශීලක කළ ඉල්ලීම පිළිගත් බව මෙම තහවුරු කිරීම මගින් අදහස් නොවේ.

4.3. අරමුදල් ප්‍රේෂණය කිරීම සඳහා වන ඉල්ලීම හුදෙක්ම බැංකුවේ ප්‍රේෂණ සේවාව හරහා ගනුදෙනුවක් සිදුකිරීමට දරන උත්සාහයක් පමණක් වන අතර එම ඉල්ලීම භාරගැනීම බැංකුවේ අභිමතයට යටත් වේ. පරිශීලකගේ ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු කරන බව (අ) බැංකුව පරිශීලකයාගේ ඉල්ලීම සකසන බව තහවුරු කරන විද්‍යුත් පණිවිඩයක් හරහා හෝ (මෙහි මින්මතු "ගනුදෙනු තහවුරුකිරීම" ලෙස හඳුන්වනු ලබන) (ආ) යෙදුමේ තහවුරු කිරීමක් හරහා හෝ පරිශීලකට දැනුම් දෙනු ලැබේ.

4.4 ගනුදෙනුව තහවුරු කිරීමෙන් පසුව ඇතුළුව BOC Smart Remit යෙදුමේ සේවාවන් කිසිවක් සිදු කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුය:

4.4.1. ප්‍රතිලාභියාගේ අනන්‍යතාව පිළිබඳ සතුටුදායක සාක්ෂි ලබා ගැනීමට බැංකුව අපොහොසත් වේ නම්;
4.4.2. පරිශීලක විසින් ව්‍යාජ, සාවද්‍ය හෝ අසම්පූර්ණ තොරතුරු සපයා ඇත්නම්;
4.4.3. ඉල්ලීමට අනුව සේවාව සැපයීමට තරම් ප්‍රමාණවත් තොරතුරු හෝ ලියකියවිලි බැංකුව වෙත සපයා නොමැති නම්;
4.4.4. පරිශීලක මෙම නියමයන් හා කොන්දේසි උල්ලංඝනය කරයි නම්;
4.4.5. මුදල් ප්‍රේෂණය කිරීම සඳහා වන ඉල්ලීම අදාළ නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කරයි නම් හෝ එම ඉල්ලීම සිදුකරන ලද්දේ තහනම් කාර්යයක් සඳහා නම්;
4.4.6. ගනුදෙනුකරන වේලාවන්හි වෙනස්කම්, මුදල් හුවමාරුව හෝ මුදල් ලබාගැනීමේ ගැටළු හෝ කිසියම් බලහත්කාර සිදුවීමක් හේතුවෙන් බැංකුව විසින් පරිශීලක ඉල්ලීම ක්‍රියාවට නැංවීමට නොහැකි වේ නම්;
4.4.7. අනුකූලතා නිලධාරියා විසින් යම් සේවාවක් සැපයීමට සිය අභිමතය පරිදි තීරණයක් ගෙන ඇත්නම්;

ගනුදෙනු තහවුරු කිරීමට පසුව වුවද BOC Smart Remit යෙදුමේ ඕනෑම සේවාවක් ඉටු කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුය.

4.5. 4.4. වන වගන්තියේ සඳහන් කර ඇති ඕනෑම තත්ත්වයක් හේතුවෙන් ප්‍රේෂණ උපදෙසකට අනුව මුදල් ප්‍රේෂණය කිරීම සම්පූර්ණ කිරීමට බැංකුව අපොහොසත් වුවහොත්, පරිශීලක හෝ ප්‍රතිලාභියා හෝ ඕනෑම තුන්වන පාර්ශ්වයක් විසින් දරන ලද කිසිදු හානියකට, පිරිවැයකට හෝ පාඩුවකට බැංකුව වගකිව යුතු නොවේ.

4.6. පරිශීලක විසින් සපයන දත්ත, තොරතුරු, උපදෙස් හා පණිවිඩ සම්බන්ධයෙන් ඔහු/ඇය වගකිව යුතුවේ. BOC Smart Remit යෙදුම සඳහා හෝ ඊට අදාළව බැංකුවට ලබාදුන් සියලුම දත්ත නිවැරදි සහ සම්පූර්ණ බව පරිශීලක විසින් සහතික කරනු ලැබේ. කිසියම් දෝෂයක්, නොගැළපීමක් හෝ අතපසුවීමක් පිළිබඳව පරිශීලක වහාම බැංකුවට දැනුම් දිය යුතුය.

4.7. BOC Smart Remit යෙදුම කෙසේ ක්‍රියාත්මක වුව ද, ඒ හරහා සිදුකරන ලද සියලුම ගනුදෙනුවල සම්පූර්ණ වගකීම පරිශීලක විසින් භාරගත යුතු අතර, පරිශීලක විසින් හෝ BOC Smart Remit යෙදුමෙන් කරන ලද ගනුදෙනු සඳහා බැංකුව කිසිඳු ආකාරයකින් වගකිව යුතු නොවන බවට පරිශීලකයා තවදුරටත් එකඟ වේ.

4.8. BOC Smart Remit යෙදුම භාවිතයෙන් ක්‍රියාත්මක කරන ලද හෝ සකසන ලද සියලුම අයදුම්පත්, ආකෘති පත්‍ර, ඉවත් කිරීමේ ලිපි, හානි රක්ෂණ ලිපි ඇතුළු බැංකුවේ නිමැවුම් හා සේවාවන්ට අදාළ සියලු ලේඛන සම්බන්ධයෙන් පරිශීලක වගකීම භාරගත යුතු අතර එම වගකීම ඒවාට පමණක් සීමා නොවිය යුතුය.

4.9. පරිශීලකගේ අනුදැනුම හෝ වෙනත් අධිකාරියක් ඇතිව හෝ නොමැතිව BOC Smart Remit යෙදුම භාවිතයෙන් කරන ලද ගෙවීමක් (මෙම යෙදුම හා සම්බන්ධ වන අවස්ථාවේ පවතින හෝ පසුව පරිශීලක විසින් විවෘත කර සම්බන්ධ කර ඇති) පරිශීලකගේ ගිණුමෙන්/ ගිණුම්වලින් හර කිරීමට පරිශීලක මෙයින් බැංකුවට බලය පවරයි.

4.10. ගිණුමේ/ගිණුම්වල ප්‍රමාණවත් මුදල් නොතිබේ නම්, BOC Smart Remit යෙදුම හරහා ගනුදෙනු කිරීමට පරිශීලක උත්සාහ නොකළ යුතුය. අදාළ දිනයේ/දිනවල ගිණුමේ/ගිණුම්වල ප්‍රමාණවත් මුදල් තිබේ නම් පමණක් ඉදිරි දිනට නියමිත ගනුදෙනු බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන බව පරිශීලක එකඟ වන අතර ගෙවීම් උපදෙස් ලැබෙන අවස්ථාවේ සහ/හෝ එම ගෙවීම් සිදුකිරීමට නියමිත අවස්ථාවේදී නම් කරන ලද ගිණුමේ/ගිණුම්වල ප්‍රමාණවත් මුදල් නොමැති නම් ගෙවීම් උපදෙස් අනුව කටයුතුකිරීමට බැංකුවට කිසිදු බැඳීමක් නොමැති බව පරිශීලක තවදුරටත් එකඟ වේ.

4.11. පරිශීලක විසින් ලබා දෙන සමහර ඉල්ලීම්/උපදෙස් බැංකුවේ නිලධාරියකුගේ/නිලධාරීන්ගේ අවසරයට යටත් වන බැවින් එකී උපදෙස්වලට ක්ෂණිකව සහ ස්වයංක්‍රීයව ක්‍රියාත්මක විය නොහැකි බවට පරිශීලක එකඟ වේ. පරිශීලකට නොදන්වා අභිමතය පරිදි එවැනි ඉල්ලීම්වලට ඉඩ දීමට හෝ අක්‍රිය කිරීමට බැංකුවට අයිතිය ඇති බව පරිශීලක තවදුරටත් එකඟ වේ.

4.12. පරිශීලක විසින් වෙනත් බැංකු/මූල්‍ය ආයතනවල ගෙවුම් උපකරණ BOC Smart Remit යෙදුමට සම්බන්ධ කළ හැකිය. ගෙවුම් උපකරණයක් BOC Smart Remit යෙදුමට සාර්ථකව සම්බන්ධ කළ පසු, බැංකුව විසින් පරිශීලක වෙත BOC Smart Remit යෙදුමේ සේවාවන් සැපයීමට අවශ්‍ය විය හැකි අදාළ ගිණුම්/කාඩ්පත් අංක ගබඩා කරනු ලැබේ. ගෙවුම් උපකරණ සම්බන්ධයෙන් පරිශීලක සහ එවැනි වෙනත් බැංකු/මූල්‍ය ආයතනයක් අතර ඇති කිසිදු ගිවිසුමකට බැංකුව පාර්ශවකරුවකු නොවන බවත් මුදල් නිකුත්කිරීමට හෝ මුදල් ලබාදීම සඳහා සුදුසුකම් නිර්ණය කිරීමට සම්බන්ධ නොවන බවත් පරිශීලකයා පිළිගනී. තවද, බැංකුව විසින් වෙනත් බැංකු/ මූල්‍ය ආයතනවලට අදාළ ගෙවුම් උපකරණ භාවිතයට පරිශීලකට ඉඩ ලබා දුන්න ද ඒවා හොඳ තත්ත්වයේ පවතින බවට හෝ BOC Smart Remit යෙදුම හරහා සිදුකරන යම් ගෙවීම් ගනුදෙනුවකට අදාළ බැංකුව/මූල්‍ය ආයතනය විසින් අවසර දීම හෝ අනුමත කිරීම සහතික කිරීම සිදුනොකරයි.

4.13. ප්‍රේෂණ ඉල්ලීම ආරම්භ කරන අවස්ථාවේදී අයකිරීම්, කොමිස්, ගාස්තු, සේවාව සඳහා වන පිරිවැය සහ අදාළ විනිමය අනුපාතය දක්වනු ලැබේ. දක්වන ලද සියලුම ගාස්තු පරිශීලකගේ ගිණුමෙන්/ගිණුම්වලින් හර කිරීමට පරිශීලක මෙයින් බැංකුවට බලය පවරයි.

5. අවලංගු කිරීම් සහ ආපසු ගෙවීම

5.1. ප්‍රතික්ෂේප වූ ප්‍රේෂණයකදී, නියෝජිතයාගෙන් සත්‍ය ලෙස ලැබුණු මුදල මත සහ ආපසු ගෙවන දිනයේදී බැංකුවේ විකුණුම් අනුපාතය අනුව පමණක් මුදල් ආපසු ගෙවිය යුතුය. ආපසු ගෙවීමේ වටිනාකම, ප්‍රතිලාභියා වෙත යැවීමට භාවිත කළ මුදලට සමාන නොවේ.

5.2. ප්‍රතිලාභීන්ගේ විස්තර වෙනස්කිරීමෙන් ප්‍රතික්ෂේප වූ ප්‍රේෂණය නැවත සකස්කිරීමට පරිශීලකයා අදහස් කරන්නේ නම්, පරිශීලක විසින් ප්‍රතිලාභීන්ගේ විස්තර යාවත්කාලීන කර එය සිදුකළ හැකිය, ප්‍රතික්ෂේප වූ ප්‍රේෂණය නැවත සකස්කිරීමට පරිශීලකයා අදහස් නොකරන්නේ නම්, ගනුදෙනුකරුවන් විසින් මුදල් ආපසු ලබා ගැනීමට ඉල්ලීමක් කළ හැකි අතර එම මුදල ලබාගැනීම සඳහා ගනුදෙනුව සිදුකළ දින සිට වැඩ කරන දින 5-7 දක්වා ගත විය හැකිය.

6. රහස්‍යභාවය සහ දත්ත ආරක්ෂණය

6.1. පරිශීලක විසින් ඇතුළත්වීමේ PIN අංකය සහ එක් වරක් පමණක් භාවිතවන මුරපදය (OTP) ඉතා රහසිගතව තබා ගත යුතු අතර කිසිඳු අවස්ථාවක කුමන තත්ත්වයක් යටතේ හෝ එම අංක/තොරතුරු කිසිඳු පුද්ගලයකුට හෙළි නොකිරීමට වගබලාගත යුතුය.

6.2. BOC Smart Remit යෙදුමට අදාළ සියලුම තොරතුරු, තාක්ෂණික ක්‍රම, දත්ත සහ සැලසුම් පරිශීලක විසින් සම්පූර්ණයෙන්ම රහසිගතව තබාගත යුතුය. පරිශීලක ඒවා කිසිවක් වෙනත් පාර්ශ්වයකට හෙළි නොකළ යුතුය.

6.3. රහස්‍යභාවය සම්බන්ධයෙන් පරිශීලකගේ වගකීම අනියත ආකාරයෙන් දිගටම පවතින අතර මෙම සේවාවේ කාලය ඉකුත්වීමෙන් හෝ අවසන් වීමෙන් එම වගකීම අවසන් නොවේ.

6.4. අදාළ නීති හා රෙගුලාසි යටතේ, ගනුදෙනුකරුවන්/පරිශීලකයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම, තහවුරු කිරීම සහ වාර්තා කිරීම සඳහා වන නෛතික නියමයන්ට

බැංකුව බැඳී සිටී. එබැවින්, පරිශීලක වෙත සේවාවන් ලබාදීමේදී ඔහුගේ/ඇයගේ පුද්ගලික දත්ත ලබා ගැනීම සහ වලංගු කිරීම සඳහා අදාළ මූලාශ්‍රයන්ගෙන් අදහස් විමසන ලෙස බැංකුව පරිශීලකගෙන් ඉල්ලාසිටී.

6.5. අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව පරිශීලකගේ පුද්ගලික තොරතුරු ආරක්ෂා කරනු ලබන අතර ඒවාට අනුකූලව සකසනු ලැබේ.

6.6. නීතිය, අධිකරණ නියෝග, යම් ව්‍යවස්ථාපිත, නෛතික හෝ නියාමන අවශ්‍යතාවයක් මගින් අපරාධ වැළැක්වීම හෝ සොයාගැනීම සම්බන්ධයෙන් හෝ වංචාව, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම සඳහා පොලිසිය හෝ වෙනත් නිසි බලධරයකු විසින් පරිශීලකගේ තොරතුරු අනාවරණය කරන ලෙස බැංකුවට නියම කරන්නේ නම්, බැංකුව විසින් එසේ කළ හැකිය. බැංකුව විසින් ඊට සැක කටයුතු ක්‍රියාවන් පිළිබඳ නිසි පරිදි නීතිය ක්‍රියාත්මක කරන්නන්ට හෝ රජයේ බලධාරීන්ට වාර්තා කළ හැකිය.

6.7. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව කටයුතු කිරීම සහ දත්ත ආරක්ෂණය ඇතුළු අදාළ නීතිවලට අනුකූලව පුද්ගලික තොරතුරු රැස් කිරීම, රඳවා තබා ගැනීම සහ භාවිතකිරීම සිදුකරන ආකාරය පිළිබඳව බැංකුවේ ආයතනික වෙබ් අඩවිය වන www.boc.lk මගින් බැංකුවේ රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය පරිශීලක විසින් කියවා තේරුම් ගත යුතුය.

7. අලාභ හෝ ප්‍රමාද දෝෂ

7.1. කුමන හෝ හේතුවක් මත BOC Smart Remit යෙදුමේ දී ඇති උපදෙස් පිළිනොගැනීම සහ/හෝ ඒවාට අනුකූලව කටයුතු නොකිරීම නිසා පරිශීලක විසින් දරන ලද යම් අලාභයක් හෝ හානියක් හෝ ලාභ පාඩු, ගිවිසුම් අහිමිවීම්, මූල්‍ය හානි හා දත්ත නැතිවීම හෝ හොඳ හිත නැතිවීම සඳහා බැංකුව වගකියනු නොලැබේ.

8. පැමිණිලි සහ අවලංගු කිරීම

8.1. බැංකුවේ වෙබ් අඩවිය වන www.boc.lk/contact හරහා හෝ 0112204750/4751/4752 අංක ඔස්සේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ ඒකකය සෘජුවම සම්බන්ධ කරගැනීමෙන් හෝ කළමනාකරු ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ ඒකකය, ලංකා බැංකුව, 22 වන මහල, "BOC චතුරශ්‍රය", අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 01

යන ලිපිනයට තැපෑලෙන් හෝ බැංකුවේ නිමැවුමක් හෝ සේවාවක් සම්බන්ධයෙන් වන යම් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.

8.2. කෙටි පණිවුඩ, විද්‍යුත් තැපෑල හෝ වෙනත් සුදුසු මාධ්‍යකින් පූර්ව දැනුම්දීමක් කිරීමෙන් BOC Smart Remit යෙදුම අවලංගු කිරීමට හෝ ඉවත්කර ගැනීමට බැංකුවට පූර්ණ අභිමතය ඇත. BOC Smart Remit යෙදුම භාවිතය අවසන් කිරීමට පරිශීලක තීරණය කරන අවස්ථාවක, BOC Smart Remit යෙදුමට අදාළ යම් ලේඛනයක් ආපසු එවන ලෙස දන්වා දින හතකට නොඅඩු පෙරාතු දැන්වීමක් පරිශීලක විසින් ලිඛිතව වහාම බැංකුවට ලබාදිය යුතුය.

9. හිමිකාරත්වය හා වෙනත් අයිතීන්

9.1. BOC බැංකුවේ Smart Remit යෙදුම සෑම විටම බැංකුවේ දේපළක් ලෙස පවතින බවට පරිශීලක එකඟ වන අතර පරිශීලක විසින් BOC Smart Remit යෙදුම හෝ ඊට අදාළ කිසිදු තොරතුරක්, තාක්ෂණික දත්ත හෝ නිර්මිතයන් පිටපත් නොකරනු ඇත.

10. හානි රක්ෂණය

10.1. පරිශීලක විසින් BOC Smart Remit යෙදුම භාවිතකිරීමේදී කුමන ආකාරයකින් දැරීමට හෝ විඳීමට සිදු විය හැකි ඕනෑම අලාභ, ගාස්තු, නඩු, හිමිකම්, වියදම් සහ හානි තමන් විසින් දරාගැනීමටත්, ඒවායින් බැංකුව ආරක්ෂා කරගැනීමටත්, බැංකුවට හානි රක්ෂණය කිරීමටත්, පරිශීලක මෙයින් එකඟ වන අතර ඉලෙක්ට්‍රොනිකව සහ/හෝ දත්ත හුවමාරු කිරීමේදී සහ/හෝ බැංකුව විසින් PIN අංකය ජනනය කිරීමේදී සහ/හෝ නිකුත් කිරීමේදී දත්ත නැතිවීමක් සහ/හෝ දත්ත වෙනත් ස්ථානයකට ලබාදීමක් සිදුවුවහොත් ඒවා තමන් විසින් දරාගැනීමටත්, ඒවායින් බැංකුව ආරක්ෂා කරගැනීමටත්, බැංකුවට හානි රක්ෂණය කිරීමටත් පරිශීලක මෙයින් එකඟ වේ.

10.2. BOC Smart Remit යෙදුම යටතේ ගනුදෙනුකිරීම සඳහා ගනුදෙනුකරු විසින් සිය දත්ත තහවුරුකිරීම/ නැවත සහතිකකිරීම අවශ්‍ය වේ. එවැනි තහවුරුකිරීමක්/ නැවත සහතිකකිරීමක් කිරීම සඳහා ගනුදෙනුකරු විසින් OTP අංකය හෝ ගනුදෙනුකරු හඳුනාගැනීමේ දත්ත භාවිත කළ හැකිය. යෙදුමට ඇතුළත්වීමේ දත්ත ආරක්ෂිතව තබා ගැනීම සහතික කිරීම සඳහා ගනුදෙනුකරු විසින් රහස්‍යභාවයට අදාළ ක්‍රියා පටිපාටි දැඩි ලෙස පිළිපැදිය යුතුය.

10.3. යෙදුම වෙත නිවැරදි තොරතුරු සැපයීම ගනුදෙනුකරුගේ වගකීම වේ.

10.4. BOC Smart Remit යෙදුම වෙත ලියාපදිංචි වීමේදී එහි ඇති නියමයන් හා කොන්දේසි පිළිගැනීමෙන්, යෙදුමෙන් පිරිනමන ලද මූල්‍ය හා මූල්‍ය නොවන ගනුදෙනු සඳහා BOC Smart Remit යෙදුම භාවිතකිරීමට ගනුදෙනුකරු එකඟ වේ.

11. පාලන නීතිය හා ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය

11.1 මෙම නියමයන් හා කොන්දේසි වලින්, ඒවා අතුරින් හෝ ඒ සම්බන්ධයෙන් හෝ ඒවායෙහි අර්ථ දැක්වීම් සම්බන්ධයෙන් හෝ ඊට අදාළ යම් පාර්ශ්වයන්ගේ අයිතීන්, වගකීම් හෝ බැඳීම් සම්බන්ධයෙන් හෝ එම නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක කිරීම, කඩකිරීම, අවසන් කිරීම හෝ ඒවායෙහි වලංගුභාවයක් සම්බන්ධයෙන් පැන නගින යම් සැකයක්, වෙනසක්, ආරවුලක්, මතභේදයක් හෝ හිමිකම් පෑමක් එහි පළමු අවස්ථාවේ දීම පරිශීලක හා බැංකුව අතර සාකච්ඡා මාර්ගයෙන් විසඳාගත යුතුය. එය අසාර්ථක වූ අවස්ථාවක, මෙම ගිවිසුම සම්බන්ධ ඕනෑම ආරවුලක් සමථයකට පත් කිරීමට පරම අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ අධිකරණ වෙත ආරවුල් යොමු කරනු ලැබේ.

පරිශීලක වන මම BOC Smart Remit යෙදුමට අදාළ නියමයන් හා කොන්දේසි කියවා තේරුම් ගෙන ඇති අතර ඉහත නියමයන් හා කොන්දේසිවලට යටත්ව BOC Smart Remit යෙදුම ක්‍රියාත්මක කිරීමට සහ භාවිත කිරීමට එකඟ වන අතර එම නියමයන් හා කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වෙමි.

ආරක්ෂිත ප්‍රේෂණ සේවා සැපයීම, නෛතික නියමයන්ට අනුකූල වීම, සහ මාගේ පළපුරුද්ද වැඩිදියුණු කිරීම යන කාර්යයන් සඳහා මගේ නම, දුරකථන අංකය, හඳුනාගැනීමේ විස්තර, මූල්‍ය දත්ත සහ මගේ ඡායාරූප ඇතුළු මාගේ පෞද්ගලික තොරතුරු රැස් කිරීමට සහ යොදාගැනීමට මම මෙයින් පැහැදිලිවම මාගේ කැමැත්ත ලබා දෙමි. අවශ්‍ය වූ විට පමණක් රඳවා ගනිමින්, සේවා සැපයීම සඳහා නෛතිකව නියම කළ විට හෝ අත්‍යවශ්‍ය වූ විට පමණක් හුවමාරු කරමින් මාගේ දත්ත ප්‍රමිතිගත ආරක්ෂිත පියවරයන්ගෙන් සුරක්ෂිත වන බව මා තේරුම් ගෙන ඇති අතර මාගේ දත්ත වෙත ප්‍රවේශ වීමට, ඒවා නිවැරදි කිරීමට, හෝ මකා දැමීමට මා සතු අයිතිය ද,

කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට, හෝ අවශ්‍ය වුවහොත් පැමිණිලි ගොනු කිරීමට ඇති අයිතිය පිළිබඳව ද මම දැන සිටිමි.

පෞද්ගලික දත්ත සැකසීම සඳහා මම මගේ කැමැත්ත ලබා නොදෙමි.